# කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

ජාතින්ගේ සංවර්තනය උදෙසා සභාවට සම්පත්

# පාඨමාලා විස්තර සටහන
# 2020

ශුද්ධ ලියවිල්ල අපට අභියෝග කරන්නේ ලෝකයේ ආකාරයට (ආකෘතියට) මඩිනු ලැබීමට ඉඩ නොහැර අපගේ මනස් අලුත් කරගැනීම මගින් පරිවර්තනය විය යුතු බවයි (රෝම 12:1-2).

දිය දොළවල් ළඟ රෝපණය කරන ලද, ගැඹුරින් මුල් බැස ඇති, අහිතකර දේශගුණික තත්ත්වයන් යටතේ වුවද සමෘධිමත්වන, නියම කලට ඵල දරන ගසක් බඳු වූ ඇදහිලිවන්තයා (ගීතාවලිය 1) පිළිබඳව බයිබලය අපට ඉතා පියකරු සිතුවමක් ලබා දෙයි. සෑම ගසක්ම එකිනෙකට වෙනස්ය - නමුත් ඵලදැරීම සඳහා ඒවාට අවශ්‍ය වන සම්පත් එක හා සමානය - එනම් වචනයෙන් පොහොසත් වූ පස සහ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ජීවනදායක ජලය. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය පවතින්නේ කිතුණුවන්ට ඔවුන්ගේ හදවත්, මනස් සහ ජීවිත පරිවර්තනය කිරීමට දෙවියන් වහන්සේගේ වචනයෙහි බලය සහ උන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ බලය අත්විඳින්නට උපකාර කිරීමටය.

දෙවියන් වහන්සේගේ ස්වීරසාර වචනය තුළ මුල්බැසගනිමින් වෙනස් වන්නාවූ ලෝකයත් සමඟ සම්බන්ධවන්න. බයිබලය, දේවධර්මය, සදාචාරය (ආචාර ධර්ම), විද්‍යාව, මනෝ විද්‍යාව සහ ඉතිහාසය පිළිබඳ සීටීඑස් පාඨමාලා සියල්ලම අරමුණු කර ඇත්තේ දේව රාජ්‍යයේ පරිණාමීය හා පරිවර්තනීය නියෝජිතයන් සන්නද්ධ කිරීම සඳහාය.

ඔබ කොතැනක සිටියද එමෙන්ම කුමක් කිරීම සඳහා කැඳවනු ලැබුවද එය විශිෂ්ට ලෙස කර ඵල දරන්න.

ඔබගේ මුල් ගැඹුරටම විහිදන්න.

ඔබට උපකාර කිරීමට කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයට ඉඩ හරින්න. ඔබගේ කථාවෙහි කොටසක් වීමට අපි ප්‍රිය කරමු.

**1971 අංක 32 දරන ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ආඥා පනත මගින් සංස්ථාගත කර ඇති කොළඹ බයිබල් විද්‍යාලයේ එකම අංශයයි.**

**ශ්‍රී ලංකා ජාතික ධර්මදානි සන්ධානයේ සාමාජික (NCEASL)**

**ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සාමාජික (NCCSL)**

**ආසියාතික දේවධර්ම සංගමයේ තෘතික අධ්‍යාපන ආයතනයක් ලෙස පිළිගත් (ATA)**

# සන්නිවේදන තොරතුරු

| | |
|---|---|
| **දුරකථන අංකය** | **+94 11 5524257** |
| **වෙබ් පියස** | **www.cts.lk** |

**ලේඛකාධිකාරී**
රන්මලී සෙනෙවිරත්න මෙනෙවිය — registrar@cts.lk

**ශිෂ්‍ය ගිණුම් කටයුතු**
ඔගස්ටීන් සෙබස්තියන් මහතා — augustin@cts.lk

**ශිෂ්‍ය ශිෂ්‍යත්ව**
රොෂේල් හේකල්-රණසිංහ මිය — rochelle@cts.lk

**පුස්තකාලය**
කැම්රන් ඩෙවී මහතා — library@cts.lk

**තොරතුරු තාක්ෂණය**
නිර්මල ප්‍රනාන්දු මහතා — it@cts.lk

**ප්‍රායෝගික සේවා පුහුණුව**
කුමාර් සුබ්‍රමනියම් මහතා — kumar@cts.lk

**ශාස්ත්‍රපති වැඩසටහන්**
දේවගැති අර්නස්ට් නදීම් — ma@cts.lk

**පීඨාධිපති**
දේවගැති රවීන් කල්දේරා — ravin@cts.lk

**ශාස්ත්‍රීය ප්‍රවර්ධන අංශාධිපති**
ආචාර්ය මනෝ ඉමෑනුවෙල් — mano@cts.lk

**නියෝජ්‍ය විදුහල්පති**
ප්‍රබෝ මිහිඳුකුලසූරිය මහතා — prabo@cts.lk

**විදුහල්පති**
ආචාර්ය අයිවෝ පූබාලන් — ivor@cts.lk

# පටුන


පිටු අංකය

**සාමාන්‍ය තොරතුරු** **4**

## 2 වාරය: මැයි—අගෝස්තු

කාල සටහන **6**

උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා **7 – 9**

සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා **9 – 10**

දේවධර්ම උපාධි සම්මන්ත්‍රණ **11**

**කථිකාචාර්යවරුන්ගේ විස්තර** **12 – 14**

**CTS පාඨමාලා විස්තර** **15**

# සාමාන්‍ය තොරතුරු

## CTS පාඨමාලා

- අපගේ පාඨමාලා සාමාන්‍යයෙන් පවත්වන්නේ සතියකට පන්තියක් බැගින් සති 12ක කාලයක් පුරාය.
- කෙටිකාලීන පාඨමාලා සම්පූර්ණ දින 4ක් පුරා පැවැත්වෙන කඩිනම් අධ්‍යයන පාඨමාලා වේ.
- බොහෝ පාඨමාලාවන්හි පන්තිය තුළ ගත කරන කාලයේ එකතුව පැය 24ක් නමුත් ඇතැම් ඒවායේ පැය 36ක මුළු එකතුවක් තිබිය හැකිය. එසේ නැතහොත් පැය 24ක පන්ති කාමර කාලයක්ද පැය 12ක ප්‍රායෝගික ක්‍රියාකාරකම් කාලයක්ද අඩංගු විය හැකිය.

## CTS පාඨමාලා ගාස්තු

පාඨමාලාවක් සඳහා හඳුන්වාදීමේ ගාස්තුව රු. 4000/- කි.

** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා සහනදායි මිලකට සිසුන්ට සැපයීමට හැකිව ඇත. එය සේවයේ මිතුරන්ගේ නොමසුරු මූල්‍ය දායකත්වය නිසා බැව් අපි කෘතඥතා පූර්වකව සිහිපත් කරමු. මෙම සුවිශේෂී සැපයුමේ යහපත් ගබඩාකරුවන් වීම සිසුන්ගෙන් අපේක්ෂා කෙරේ.*

## CTS හි ලියාපදිංචි වීම

සම්පූර්ණ කරන ලද ලියාපදිංචි වීමේ අයදුම් පත හා ලියාපදිංචි වීමේ ගාස්තුව ගිණුම් අංශයට භාර දෙන්න. ලියාපදිංචි වීමේ අයදුම්පත **www.cts.lk** වෙබ් අඩවියෙන් හෝ කොහුවල පිහිටි කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙන් ලබාගත හැකිය.
**කරුණාකර සලකන්න:** *පන්තියේ ඔබගේ ස්ථානය වෙන් කරනු ලබන්නේ පාඨමාලාව සඳහා ඔබ සම්පූර්ණ ගාස්තුව ගෙවූ පසුවය.*

**වැදගත්: <u>පළමු වරට</u> පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වන්නන් ඔබගේ සභාපාලකතුමාගෙන් අවසරය සහිත ලිපියක් රැගෙන ආ යුතුය.**

## ලියාපදිංචි වන දින හා වේලාවන්

වැඩකරන දිනයන්හි (සඳුදා සිට සිකුරාදා) උදේ 9.00 සිට සවස 4.30 දක්වා.

**කරුණාකර සලකන්න:** *යම් වාරයක් සඳහා ලියාපදිංචි විය හැක්කේ එම වාරය ආරම්භ වන දින දක්වා පමණි.*
**දෙවන වාරය: 2020 මැයි 25**

**වැඩි විස්තර/ සහය සඳහා විමසන්න:**
**අධ්‍යයන කාර්යාලය**
**011 5524257; registrar@cts.lk; www.cts.lk**

# 2 වාරය

## 2020 මැයි - අගෝස්තු

# කාල සටහන - 2 වන වාරය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| උදෑසන | **දරුදැරියන් සඳහා ශ්‍රාවකත්වය**<br>පෙ.ව.9:00–පෙ.ව.11:15<br>ක්‍රිෂ්නි එදිරිසිංහ | **ප්‍රධාන දේව වේද සම්ප්‍රදායන් ගවේෂණය**<br>පෙ.ව.9:00–ප.ව.12:00<br>ප්‍රබෝ මිහිඳුකුලසූරිය | **දෙවියන් වහන්සේ සහ ලෝකය**<br>පෙ.ව.9:00–ප.ව.12:30<br>සරත් ද සිල්වා/ රවීන් කල්දේරා<br>සහභාගිකමේ කාලය පෙ.ව.10.30–පෙ.ව.11.30 | **ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය I**<br>පෙ.ව.9:00–ප.ව.12:30<br>ජී. පී. වී. සෝමරත්න<br>දේව මෙහෙය පෙ.ව.10.30–පෙ.ව.11.30 | **සභා ආකෘති**<br>පෙ.ව.9:00–ප.ව.12:30<br>රවීන් කල්දේරා<br>**කිතුනු සේවකයෙකුගේ ජීවිතය සහ කාර්යය**<br>පෙ.ව.9:00–පෙ.ව.11:30<br>දුලිප් ප්‍රනාන්දු |
| දහවල් | **ආත්මික දීමනා භාවිතය**<br>ප.ව.3:00–ප.ව.5:15<br>විමලසේන ජයලත් | **නව ගිවිසුමට හැඳින්වීමක්**<br>ප.ව.3:00–ප.ව.5:00<br>රවීන් කල්දේරා/ නාමල් වීරසිංහ | **බලපෑමක් ඇති කළ දූතනගාමියෝ**<br>ප.ව.3:00–ප.ව.5:00<br>ඇන්තනි සයිමන් | **ගිවිසුම සහ කරුණාව**<br>ප.ව.3:00–ප.ව.5:15<br>ජ්න්ස්ටින් ප්‍රනාන්දු | **ළමයා, කිතුනු සභාව හා ධර්මදූත සේවය**<br>ප.ව.3:00–ප.ව.5:30<br>චමිලා සුභාෂ් රණසිංහ |
| සවස | **පලදායී නායකයන්ගේ පුරුදු 7ක්**<br>ප.ව.6:00–ප.ව.8:00<br>සුරංග අතුකෝරාළ | **යෙසායා**<br>ප.ව.6:00–ප.ව.8:00<br>මහින්ද මුණසිංහ | **නිරෝගී විවාහයක් සඳහා උපදේශනය**<br>ප.ව.6:00–ප.ව.8:00<br>ජ්න්ස්ටින් ප්‍රනාන්දු | **අධ්‍යයන ක්‍රමවේද**<br>ප.ව.6:00–ප.ව.8:15<br>රවීන් කල්දේරා | **ධර්මදූත සේවයට හැඳින්වීමක්**<br>ප.ව.6:00–ප.ව.8:30<br>සනත් අතුකෝරාළ |

නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.

2 වන වාරය
2020 මැයි - අගෝස්තු
# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## දරුදැරියන් සඳහා ශ්‍රාවකත්වය

මහා පැවරීම මගින් සියලුදෙනා වෙත ධර්මිනය මෙන් ම, ශ්‍රාවකත්වය සඳහා පුහුණු කිරීමට කිතුනු අපට වගකීමක් ඇත. මා වෙතට දරුවන්ට පැමිණෙන්නට නොවළක්වන්නැයි ජේසුස් වහන්සේ පැවසූ සේක. ඒ හෙයින් දරුදැරියන් ජේසුස් වහන්සේ වෙතට පැමිණ උන් වහන්සේ ගේ භක්තිමත් ශ්‍රාවකයකු කරන්නේ කෙසේදැයි මෙම පැඨමාලාවෙන් හැඳැරීමට අවස්ථාවක් සැලසේ.

BTh වෛකල්පික
Dip අතිරේක

සති 11
දිනය: සඳුදා
වේලාව: පෙ.ව. 9:00–11:15
ආරම්භය: ජුනි 1
සම්මාන: 2
කථිකාචාර්ය: **ක්‍රිෂ්නි එදිරිසිංහ**

## ආත්මික දීමනා භාවිතය

සභාව නිරෝගී ලෙස වර්ධන සඳහා ශුද්ධාත්මයාණන් විසින් දානය කරන ලද ආත්මික දීමනා සෑම කිතුනුවෙකු වෙත ඇත්තේ ය. බයිබලීය ලෙස දේව වචනයේ ආත්මික දීමනා පිළිබඳ අවබෝධ කර ගැනීමටත්, දෙවියන් වහන්සේ ඔබ විසින් සභාවට සේවය කරනු වස් දී ඇති ආත්මික දීමනා වර්ධනය කර ගන්නා අයුරු මෙම පාඨමාලාවෙන් ඔබට අවබෝධ කර ගත හැකි ය.

BTh වෛකල්පික
Dip අතිරේක

සති 11
දිනය: සඳුදා
වේලාව: ප.ව. 3:00–5:15
ආරම්භය: මැයි 25
සම්මාන: 2
කථිකාචාර්ය: **විමලසේන ජයලත්**

## නව ගිවිසුමට හැඳින්වීමක්

නව ගිවිසුමේ පොත් තෝරා ගත් ආකාරය හා ඒවා පිළියෙළ කළ ආකාරය ඉගෙන ගත හැකිය. නව ගිවිසුමේ සෑම පොතකම අඩංගු ප්‍රධාන පණිවිඩය හා එහි කතෘත්වය, නව ගිවිසුමේ පොත් සභාවට පළමු වතාවට ලැබුණු විට සිදුවුණු දේ පිළිබඳ ගවේෂණය කළ හැකිය. නව ගිවිසුම් සාහිත්‍ය පිළිබඳ පුළුල් අවබෝධයක් මෙම පාඨමාලාවෙන් ඔබට ලැබේ.

BTh අනිවාර්ය
Dip අනිවාර්ය

සති 12
දිනය: අඟහරුවාදා
වේලාව: ප.ව. 3:00–5:00
ආරම්භය: මැයි 26
සම්මාන: 2
කථිකාචාර්ය: **රවීන් කල්දේරා/ නාමල් වීරසිංහ**

## දෙවියන් වහන්සේ සහ ලෝකය

දෙවියන් වහන්සේගේ ස්වභාවය හා ගුණාංග, මවන ලද ලෝකය, මනුෂ්‍යත්වය හා පාපයට වැටීම, යන මූලික මාතෘකා වෙත අවධානය යොමු වේ. ක්‍රමික දේව ධර්මය විෂය මාලාවේ පළමු අදියරයි. බයිබලීය පදනම මුල් කරගෙන, කිතුනු චින්තන ඉතිහාසයෙන් හා සමකාලීන සංවාදයන්ද ආශ්‍රිතව අධ්‍යයනය කෙරෙනු ලැබේ.

BTh අනිවාර්ය
Dip අනිවාර්ය

සති 12
දිනය: බදාදා
වේලාව: පෙ.ව. 9:00–ප.ව. 12:30
ආරම්භය: මැයි 27
සම්මාන: 2
කථිකාචාර්ය: **සරත් ද සිල්වා/ රවීන් කල්දේරා**

2 වන වාරය
2020 මැයි - අගෝස්තු

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## බලපෑමක් ඇති කළ දූතනගාමියෝ

BTh වෛකල්පික
Dip අතිරේක

දෙවියන් වහන්සේගෙන් මහත් දේ බලාපොරොත්තු වූ හා උන්වහන්සේ වෙනුවෙන් මහත් දේ සඳහා වෙහෙස වූ මිනිසුන්ගේ ජීවිත හා මෙහෙය දෙස බැලීමක් මෙයින් සිදුවේ. දෙවියන් වහන්සේ මේ විශ්වාසවන්ත සේවකයන් තුළින් ඔබ ප්‍රබෝධවත් කර නිර්භීතව හා විශ්වාසවන්තව ක්‍රිස්තුස් වහන්සේ අනුගමනය කිරීමට ඔබට උගන්වන සේක්වා.

සති 12
දිනය: බදාදා
වේලාව: ප.ව. 3:00–5:00
ආරම්භය: මැයි 27
සම්මාන: 2
කථිකාචාර්ය: **ඇන්තනි සයිමන්**

## ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය I

BTh අනිවාර්ය
Dip අනිවාර්ය

ආරම්භයේ සිට ප්‍රතිසංස්කරණය දක්වා

ක්‍රිස්තියානි සභාව ආරම්භයේ පටන් ප්‍රතිසංස්කරණය දක්වා කාලය අතරතුර මිනිසුන්ගෙන්ද සිද්ධීන්ගෙන්ද දේවධර්මයන්ගෙන්ද පෝෂණය වී හැඩ ගැසී පැමිණ ඇත. සභාවේ මුල් වසර 1400 තුළ බිහිවූ ප්‍රාණපරිත්‍යාගවරු, තපස්වරු, ධර්මදූතයෝ සහ ප්‍රගමනයන් මෙම අධ්‍යයනයේ දී ඔබට මුණගැසෙනු ඇත.

සති 11
දිනය: බ්‍රහස්පතින්දා
වේලාව: පෙ.ව. 9:00–ප.ව. 12:30
ආරම්භය: මැයි 28
සම්මාන: 2
කථිකාචාර්ය: **ජී. පී. වී. සෝමරත්න**

## ගිවිසුම සහ කරුණාව

BTh වෛකල්පික
Dip අතිරේක

හොසියා සිට මලාකි

දිවැසිවර ග්‍රන්ථ කාණ්ඩයේ වැදගත් කොටසක් සුළු දිවැසිවර ග්‍රන්ථ හෙවත් දිවැසිවරුන් දොළොස්දෙනා මඟින් රචනා කොට ඇත. එහි සාකච්ඡාවට ගනුයේ මෝසෙස්ගේ ගිවිසුම වෙත ජනතාව හැරවීමය. සමාජ සාධාරණය, යුක්තිය වැනි සමාජ ගැටලුවලට හේතුව වන්නේ දයාව නොමැතිකමය. වර්තමාන සමාජ යථාර්ථයට දිවැසිවර පණිවුඩය අදාළ කරන්නේ කෙසේදැයි මෙයින් ගවේෂණය කෙරේ.

සති 11
දිනය: බ්‍රහස්පතින්දා
වේලාව: ප.ව. 3:00–5:15
ආරම්භය: මැයි 28
සම්මාන: 2
කථිකාචාර්ය: **ජින්ස්ටින් ප්‍රනාන්දු**

## කිතුනු සේවකයෙකුගේ ජීවිතය සහ කාර්යය

BTh වෛකල්පික
Dip අතිරේක

කිතුනු සේවකයෙකු වීමේ අද්විතීය කැඳවීම තේරුම් ගැනීමට උපකාරී වන විෂයකි. ප්‍රාදේශීය සභාවේ ද සමාජයේ ද උද්යෝගීමත්, බලවත් සේවකයෙකු විය හැක්කේ කෙසේද? නායකයෙකු ලෙස වර්ධනය වන අතරම, ආත්මික ජීවිතය ද ශක්තිමත් පවුල් සබඳතාවයක් ද තබා ගන්නා ආකාරය ඉගෙනීමට අවස්ථාව ලැබේ.

සති 10
දිනය: සිකුරාදා
වේලාව: පෙ.ව. 9:00–11:30
ආරම්භය: මැයි 29
සම්මාන: 2
කථිකාචාර්ය: **දුලීප් ප්‍රනාන්දු**

2 වන වාරය

2020 මැයි - අගෝස්තු

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## ළමයා, කිතුනු සභාව හා ධර්මදූත සේවය

ළමයෙකුට හිතැති දේවස්ථාන පසුබිමක් බයිබලයානුකූලව ගොඩනැගීමට කාලීන අවශ්‍යතාවක් ඇත. සාකල්‍ය ළමා සංවර්ධනයක් තුළින් ළමයා, කිතුනු සභාව හා ළමා ධර්මදූත සේවය පිළිබඳ පුළුල් අවබෝධයක් හා ප්‍රායෝගික අත්දැකීමක් මෙම පාඨමාලාව සපයයි.

BTh වෛකල්පික
Dip අතිරේක

සති 10

දිනය: සිකුරාදා

වේලාව: ප.ව. 3:00–5:30

ආරම්භය: මැයි 29

සම්මාන: 2

කථිකාචාර්ය: **චමිලා සුභාෂ් රණසිංහ**

# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පලදායී නායකයන්ගේ පුරුදු 7ක්

නායකත්වය තනතුරක් නොව කර්තව්‍යයකි. කිතුනු නායකයන් මුහුණපාන විශාලතම අභියෝගය වන්නේ ඔහුට හෝ ඇයට දෙවියන් වහන්සේ විසින් පවරන ලද කර්තව්‍ය තුළ දිගුකාලීනව පලදායී වන්නේ කෙසේද යන්නයි. බයිබලීය දෘෂ්ටියක් සහිතව ස්ටීවන් කොවේ විසින් ලියන ලද *The 7 Habits of Effective Leaders* නමැති පොත මෙම පාඨමාලාවේදී ගවේෂණය කරනු ඇත. පලදායී නායකයකු වීමට ඔබට එය උපකාර වනු ඇත.

BTh වෛකල්පික
Dip අතිරේක

සති 12

දිනය: සඳුදා

වේලාව: ප.ව. 6:00–8:00

ආරම්භය: මැයි 25

සම්මාන: 2

කථිකාචාර්ය: **සුරංග අතුකෝරාළ**

## යෙසායා

අතිශයින් සිත්ගන්නා සුලු පාඨමාලාවක් වන මෙයින් යෙසායා පොතේ ඓතිහාසික පසුබිම, කර්තෘත්වය, තීරණාත්මක සංසිද්ධීන් සහ අන්තර්ගත පණිවිඩය වර්තමානයට අදාළ වන පරිදි අධ්‍යයනය කරනු ලැබේ. දෙවියන් වහන්සේ පිළිබඳ, පැමිණෙන්නට තිබෙන මෙසායා පිළිබඳ අනාගත වාක්‍ය සහ දේව රාජ්‍යයේ පරිසමාප්තිය පිළිබඳ ඉගෙන ගත හැකිය.

BTh වෛකල්පික
Dip අතිරේක

සති 12

දිනය: අඟහරුවාදා

වේලාව: ප.ව. 6:00–8:00

ආරම්භය: මැයි 26

සම්මාන: 2

කථිකාචාර්ය: **මහින්ද මුණසිංහ**

2 වන වාරය

2020 මැයි - අගෝස්තු

# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## නිරෝගී විවාහයක් සඳහා උපදේශනය

BTh වෛකල්පික
Dip අතිරේක

විවාහකයන් පෙර නොදුටුවිරු අභියෝගවලට වත්මනේ මුහුණ දෙයි. අවශ්‍ය උපකාර ලබාගත නොහැකිව බොහෝ දෙනා ප්‍රශ්නවලට මැදිවී සිටිති. උපදේශන කුසලතා සහිත සංවේදීවූත්, පරිණතවූත් සේවක සේවිකාවන්ගේ කාලීන අවශ්‍යතාවක් සභාවට ඇත. එම සේවය තුළින් විවාහකයන් සාර්ථක පවුල් ජීවිතයක් කරා සූදානම් කිරීම හා උපදේශනය සඳහා මගපෙන්වන්නකි.

සති 12

දිනය: බදාදා

වේලාව: ප.ව. 6:00–8:00

ආරම්භය: මැයි 27

සම්මාන: 2

කථිකාචාර්ය: **ජින්ස්ටීන් ප්‍රනාන්දු**

## අධ්‍යයන ක්‍රමවේද

BTh අනිවාර්ය
Dip අනිවාර්ය

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ මෙහෙවරෙහි දක්වන කරුණක් වන්නේ “උසස්ම ශාස්ත්‍රීය ප්‍රමිතියට අනුව...” අපගේ පුහුණුව කරන බවය. එහෙයින් මෙම පාඨමාලාව කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ විෂය නිර්දේශයන්හි අවශ්‍යතාවන් පැහැදිලි කර දෙන අතර කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සිසුවෙකු ලෙස විශිෂ්ටත්වයට පත් වීමට ඇවැසි සටහන් තබාගැනීමේ හැකියාව, වේගයෙන් කියවීම, පර්යේෂණ කිරීම, රචනා ලිවීම ආදී කුසලතාවන්ගෙන් ඔබ පූර්ණ කරනු ලබයි.

සති 11

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: ප.ව. 6:00–8:15

ආරම්භය: මැයි 28

සම්මාන: 0 (2)

කථිකාචාර්ය: **රවීන් කල්දේරා**

## ධර්මදූත සේවයට හැඳින්වීමක්

BTh අනිවාර්ය
Dip අනිවාර්ය

“දූතනය” සෑම කිතුනුවෙකුම අසා ඇති වචනයකි, එහි පැහැදිලි අවබෝධයක් නොපවතියි, මෙම පාඨමාලාව ඔබ දූතනයේ විවිධ පැතිකඩ තුළින් ගෙන යන අතර දෙවියන් වහන්සේගේ දූතනය තුළ ඔබටත්, සභාවටත් ඇති සුවිශේෂ කාර්යභාරය විවිධ මං ඔස්සේ අභියෝගාත්මක ලෙස ඉටුකිරීමට ඔබ සූදානම් කරයි.

සති 10

දිනය: සිකුරාදා

වේලාව: ප.ව. 6:00–8:30

ආරම්භය: මැයි 29

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

2 වන වාරය

2020 මැයි - අගෝස්තු

# දේවධර්ම උපාධි සම්මන්ත්‍රණ

මෙම සම්මන්ත්‍රණ සකසා ඇත්තේ උපාධිය හෝ ශාස්ත්‍රපති වැඩසටහන්වලට ලියාපදිංචි වූ අය සඳහාය. පංති කාමරයක වැනි සැකැස්ම දේශනයක් හා සම්මන්ත්‍රණයක් අතර සමබරතාවය ඇත. අමතර කියවීම් හා පර්යේෂණ මත පදනම්ව සිසුන් සාකච්ජා සඳහා පත්‍රිකා සකස් කළ යුතුය.

උපාධි පාඨමාලාවේ ලියාපදිංචිය හා සම්මාන 60 සම්පූර්ණ කර තිබීම පූර්ව අවශ්‍යතාවන්ය.

## ප්‍රධාන දේව වේද සම්ප්‍රදායන් ගවේෂණය

BTh අනිවාර්යය

ස්වතන්ත්‍රවාදී දේවධර්මය හා විමුක්තිය අතර වෙනස කුමක්ද? ධර්මදානි සම්ප්‍රදායේ විශේෂාංග මොනවාද? රෙපරමාදු දේවධර්මයේ පදනම් මොනවාද? කිතුනු නිකායන් බොහෝ විට දේවධාර්මික සම්ප්‍රදායන් මත පිහිටුවා ඇති අතර නිකාය භේදයටද හේතුවී ඇත. සෑම ප්‍රධාන දේවධර්ම සම්ප්‍රදායකම මූලාරම්භය ව්‍යාප්තිය හා නියෝජිත දේවධර්මවේදීන් පිළිබඳ සොයා දැනගැනීමටත්, එක් එක් සම්ප්‍රදායේ සාධනීය හා නිශේධනීය පැතිකඩයන් ඇගැයීමටත් ශිෂ්‍යයන්ට අවස්ථාව ලැබෙනු ඇත.

සති 12

දිනය: අඟහරුවාදා

වේලාව: පෙ.ව. 9:00–12:00

ආරම්භය: **මැයි** 26

සම්මාන: 3

කථිකාචාර්ය: **ප්‍රබෝ මිහිඳුකුලසූරිය**

## සභා ආකෘති

BTh අනිවාර්යය

සෑම රටකම ඇති ක්‍රිස්තියානි සභාව ඔපවන්නේ එහි ඇති හරවත් විවිධවූ සම්ප්‍රදායන් නිසාය. මෙම පාඨමාලාව විවිධ ක්‍රිස්තියානි නිකායන්වල ආවේණික වූ සක්‍රමේන්තු, පොදු නමස්කාරය හා පරිපාලන සම්ප්‍රදායන්ගේ දේවධාර්මික හා ඓතිහාසික සම්භවය ගැන හැදෑරීමක් කරයි. විශ්ව සභාව තුළ ඇති විවිධත්වය අගය කිරීමට ශිෂ්‍යයා ඉගෙන ගනු ඇත.

සති 10

දිනය: සිකුරාදා

වේලාව: පෙ.ව. 9:00–12:30

ආරම්භය: මැයි 29

සම්මාන: 3

කථිකාචාර්ය: **රවීන් කල්දේරා**

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**ක්‍රිෂ්නි එදිරිසිංහ,** BTh, MA (candidate)
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියක් වන ඇය වසර විස්සකට ආසන්න කලයක් ඉරුදින පාසලේ හා පෙරපාසල් ගුරුවරියක් වශයෙන් ද සේවය කොට ඇත. “ශ්‍රී ලංකා ළමා ධර්මදාන සහභාගිත්වයේ (CEF)” මොරටු ශාඛාවේ අධ්‍යක්ෂිකාව ලෙස සේවය කරන ලදී. ඇය පිලිපීනයේ ආසියා-ශාන්තිකර නසරීන දේවධර්ම ශාස්ත්‍රාලයේ (APNTS) සාකල්‍ය ළමා සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියේ අවසාන පර්යේෂණ නිබන්ධනයේ කටයුතුවල නියැලෙමින් සිටින්නීය.



**විමලසේන ජයලත්,** BTh, LDD, MA
මෙතුමා සිව්චතුරස්‍ර සභාවේ මධ්‍යම පළාතේ වැඩ බලන දේවගැතිවරයා ලෙස ද එම සභාවේ කමිටු සාමාජිකයෙකු හා කිතුනු අධ්‍යාපන අංශයේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස ද සේවය කරයි. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි.



**රවීන් කල්දේරා,** DipAgri, BTh, BA, MA
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පීඨාධිපතිය. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ හා විවෘත විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකි. ඩලස් දේවධර්ම ශාස්ත්‍රාලයෙන් බයිබලීය අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇති හෙතෙම අවුරුදු ගණනාවක පුරෝගාමී සභාරෝපණ සේවයේ අත්දැකීම් ඇත්තෙකි. පුරාතන මැදපෙරදිග හා බයිබලයේ භූගෝලය පිළිබඳ අවබෝධය නිසා ලංකාවේ ප්‍රකාශනයන්හි සිතියම් නිර්මාණය සඳහා සම්පත් දායකයකු ලෙස කටයුතු කොට ඇත. ජීවමාන ක්‍රිස්තු සභාවේ දේවගැතිවරයෙකි.



**නාමල් වීරසිංහ,** BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. යෞවන කිතුමඟ සංවිධානයේ හි (Youth For Christ) වසර 22ක පූර්ණකාලීන සේවයේ නියැලි සිටින එතුමන් වර්තමානයේ දකුණු පළාත් සේවය භාරව කටයුතු කරනු ලබයි. එතුමන් ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ ගිහි දේශකයකු ලෙසද කටයුතු කරයි.



**සරත් ද සිල්වා,** BTh, MDiv
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ දේවවේදී උපාධියද, පිලිපීනයේ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL) නායකත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. වසර 27කට වඩා විවිධ ක්ෂේත්‍රවල පුළුල් සේවා අත්දැකීම් සහිත මෙතුමා වර්තමානයේ ඌව හා නැගෙනහිර පලාත්හි පුරෝගාමී මෙහෙවරක යෙදී සිටින අතර කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ අර්ධකාලීන කථිකාචාර්යවරයෙක් වශයෙන්ද කටයුතු කරයි.



**ඇන්තනි සයිමන්,** BTh
ප්‍රේස් ප්‍රෙයා ලංකා දේවස්ථානයෙහි සභාපාලකතුමා ලෙස කටයුතු කරයි. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධරයෙකි.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**ජී. පී. වී. සෝමරත්න,** BA, MA (Missiology), MA (Theology), PgDip (Demography), PhD

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පර්යේෂණ අංශ භාර මහාචාර්යතුමාය. විපුල එලැති ගවේෂකයෙකු හා අධ්‍යාපනික පොත් සහ ලිපිවල කර්තෘවරයෙකි. මෙතුමා කොළඹ විශ්ව විද්‍යාලයේ නූතන ඉතිහාසය පිළිබඳ මහාචාර්ය ධුරය හෙබවූ අතර යෙරුසලමේ හෙබ්‍රෙව් විශ්ව විද්‍යාලයේ ට්‍රෑමන් ආයතනයේ ද, ලී විශ්ව විද්‍යාලයේ සහ ෆුලර් දේවධර්ම ශාස්ත්‍රාලයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද සේවය කර ඇත. කාණ්ඩ හතකින් සමන්විත ශුද්ධ බයිබලයේ විශ්වකෝෂයේ කර්තෘවරයාය.



**ජන්ස්ටීන් ප්‍රනාන්දු,** BTh, Dip (Counselling), HND (Counselling), PgDip (BAPC)

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු හා ගුරු මණ්ඩල සාමාජිකයෙකි. කිතුසෙවණ සේවයේ කොච්චිකඩේ ශාඛාවේ දේවගැතිවරයෙකු ලෙස වසර කිහිපයක් සේවය කර තිබේ. කිතුසෙවණ ගෝලත්ව පුහුණු මධ්‍යස්ථානයේ ගුරුවරයෙක් හා උප විදුහල්පතිවරයෙක් ලෙස ද කටයුතු කර තිබේ. උපදේශන කටයුතුවල නිරත වන අතර ඒ පිළිබඳ වැඩිදුර හදාරයි.



**දුලිප් ප්‍රනාන්දු,** BSc (Eng), BD, ThM

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ දේවගැතිතුමා ලෙස සේවය කරයි. විශ්‍රාමික මෙතෝදිස්ත දේවගැතිවරයෙකි. මෙතුමා පේරාදෙනිය විශ්ව විද්‍යාලයේද ලන්ඩන් දේවධර්ම විද්‍යාලයේද (එක්සත් රාජධානිය) ෆුලර් දේවධර්ම ශාස්ත්‍රාලයේද (ඇමරිකාව) උපාධිධාරියෙකි. ඉංජිනේරු පසුබිමක් සහිත මෙතුමා කටුබැද්ද උසස් තාක්ෂණික විද්‍යාලයේද පසුව මොරටුව විශ්ව විද්‍යාලයේද දේශකයකු ලෙස කටයුතු කර ඇත. එතුමා ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ සභාපතිවරයෙකු ලෙසද සේවය කර ඇත.



**චමිලා සුභාෂ් රණසිංහ,** BTh

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිනියකි. වසර 8ක කාලයක් සභාපාලිකාවක් ලෙස සේවයේ නිරතව සිටි අතර, පසුව ජීවිතාලෝක ආයතනයේ සිංහල සේවා කළමණාකාරිනිය වශයෙන්ද කටයුතු කරන ලදී. ගුවන්විදුලි සහ රූපවාහිනියේ කිතුනු වැඩසටහන් නිෂ්පාදිකාවක්-නිවේදිකාවක් වශයෙන්ද කටයුතු කර ඇති අතර, ලේඛිකාවක්ද වෙයි. ළමා සහ තරුණයන් අතරේ ඉගැන්වීමේ විශේෂ සේවයන් කරන අතර මෙතෝදිස්ත සභාවේ ගිහි නායිකාවක්ද වෙයි.



**සුරංග අතුකෝරාළ,** BTh, ADCN, DIM

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු වන අතර, හිටපු තොරතුරු තාක්ෂණ කළමනාකරු හා සහකාර පුස්තකාලයාධිපතිවරයාය. ජනතා දේවසභාවේ ප්‍රාදේශීය නායකයෙකු ලෙස සේවය කරන අතර පාලන මණ්ඩලයේ ලේඛකාධි ධුරයද දරයි. වර්තමානයේ පවර් වර්ල්ඩ් ශාරීරික සුවතා මධ්‍යස්ථාන ජාලයේ සාමාන්‍යාධිකාරීවරයා වශයෙන්ද කටයුතු කරන්නේය.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**මහින්ද මුණසිංහ,** BTh, MA

ගුරු මණ්ඩලයේ සාමාජිකයෙකි. එසේම ව්‍යාප්ති සේවා සම්බන්ධිකාරකවරයෙකු ලෙස ද කටයුතු කරයි. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු වන අතර කැම්පස් ක්‍රෑසේඩ් සහ නැවිගේටර්ස් හි දිගු කාලීන ලෙස සේවය කොට ඇත. පිලිපීනයේ ජාත්‍යන්තර නායකත්වය පිළිබඳ විද්‍යාලයේ (IGSL) පරිවර්තනාත්මක නායකත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. මෙතෝදිස්ත සභාවේ ගිහි දේශකයෙකු සහ නායකයෙකු ලෙස ද සේවය කරන්නේය.



**සනත් අතුකෝරාළ,** BSc, BTh, MA, PhD (candidate)

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ගුරුමණ්ඩලයේ සාමාජිකයෙකි. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ හා කොරියාවේ ටෝර්ච් ට්‍රිනිටි දෙවිසත්හලේ උපාධි ලබා ඇති අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විද්‍යා උපාධිධාරියෙකි. වසර 17 ක පූර්ණකාලීන දේව සේවයේ පළපුරුද්දක් ඇත්තෙකි.



**ප්‍රබෝ මිහිඳුකුලසූරිය,** PgDipM (CIM), MA , PhD (candidate)

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උප විදුහල්පතිවරයා වන මෙතුමා වැන්කුවර්හි රීජන්ට් විද්‍යාලයෙන් ක්‍රිස්තියානි අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. ප්‍රජා සමාජය, සරසවිය හා වෙළඳපොළ තුළ පරිපූර්ණ කිතුනු ගෝලත්වය සහ දූතනය වර්ධනය කිරීම මොහුගේ විශේෂ උනන්දුවයි. වර්තමානයේ මොහු කොළඹ විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය තුළින් යටත්විජිත සමයේ ශ්‍රී ලාංකීය ඉතිහාසයට අදාළ ආචාර්ය උපාධීන් සඳහා පර්යේෂණ නිබන්ධයක් රචනා කරමින් සිටියි. කිරුළපන කල්වාරි සභාවේ සාමාජිකයෙකු වේ.

# CTS පාඨමාලා විස්තර

ශිෂ්‍යයන් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලාවන් හැදෑරීම සඳහා සාදරයෙන් පිළිගන්නා අතර අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා අප ඔබ දිරිමත් කරන්නේ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය වෙතින් ඔබට ලබාගත හැකි උපරිමය අත්කරගනු සඳහාය.

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය විසින් පෙළ හතරක අධ්‍යාපනයක් පිරිනමයි. ඒ සියල්ල ම ආසියානු දේවවේදී සංගමය (ATA) විසින් පිළිගනු ලැබූ ඒවා වේ. ඔබට වඩාත් ගැළපෙන්නේ කුමන පාඨමාලාවදැයි කියවා අනාවරණය කරගන්න.

**ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය (CCS)**
21 වැනි සියවසේ ජීවිතය, රැකියාව හා සේවය වෙනුවෙන් (ගිහි) කිතුනුවන් සවිගැන්වීම පිණිස මෙය සැලසුම් කර ඇත.
උපදේශ මාධ්‍ය: ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ.
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 36කි.*

**දේවධර්ම ඩිප්ලෝමා (DipTh)**
කිතුනු සේවකයන් සඳහා ගැඹුරු බයිබලීය අන්තර් දෘෂ්ටියක් හා සේවය සඳහා නිපුණත්වයක් ලබාදීම සඳහා මෙය සැලසුම් කර ඇත.
උපදේශ මාධ්‍ය: ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ.
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 72කි.*

**දේවධර්ම උපාධිය (BTh)**
සභා නායකත්වය (දේවගැති සේවය, ඉගැන්වීම සහ එවැනි සේවාවන්) සඳහා කිතුනුවන් පුහුණු කිරීම සඳහා මෙය සැලසුම් කර ඇත.
උපදේශ මාධ්‍ය: ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ.
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 108කි.*

**කලා ශාස්ත්‍රපති (MA)**
සභාවට අවශ්‍ය දේශකයන්, ගුරුවරුන් හා ලේඛකයන් පුහුණු කිරීම සඳහා මෙය සැලසුම් කර ඇත.
උපදේශ මාධ්‍ය: ඉංග්‍රීසි
*පූර්ව සුදුසුකම්: අවම වශයෙන් උපාධියක් හා ඉංග්‍රීසි භාෂා නිපුණත්වයක් තිබිය යුතු වේ.*

**වැඩි විස්තර/ සහය සඳහා විමසන්න:**
**අධ්‍යයන කාර්යාලය**
011 5524257; registrar@cts.lk; www.cts.lk